THE SINHALA- ISSN 1834-7061 - Aug 2008



# තවත් වසන්තයක්

## පෙල්ටන් පීරිස් ලියූ කෙටිකතාවකි

පසුගිය මාස දහ අට පුරා මාත්, ධම්මිත්, පුතාත් ලංඩනයේ ගතකළ කාලය යම් දිනයක නවකතාවකට ගොනු කිරීමට තරම් වටිනා, විසිතුරු අත්දැකීම් ලද කාලයක්. ඒ කෙසේ වෙතත්, මීලඟ සීත සෘතුව ලැබීමට පෙර තව සති දෙකකින් ආපසු ලංකාව බලා යාමට අප කටයුතු සූදානම් කළේ ඉතා සතුටින්. රෝමන් බාත්, ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය හා වේල්ස් ප්‍රාන්තය නැරඹීමට අප සමග එක්වූනේ හිත මිත්‍ර සිරිදේව හා චතුරානි.

එදා ගෙදර එන විට මා නමට තිබූ ගුවන් ලිපිය නංගීගෙන් බව දැන ගත්තේ ඇගේ අත් අකුරින්.

"ආදරණීය අයියා හා අක්කා වෙත,

ඔබ සැම ඉතා සුවසේ ඇතැයි සිතමි. ඔබ දෙපල දැක ගැනීමටත්, චූටි පුතා ගේ ආදර සුරතල් බැලීමටත් අප සැම බලා සිටින්නේ ඉතාමත් නොඉවසිල්ලෙන් ඇඟිලි ගනිමින්. අම්මා පියදාස මාමා ගේ වාහනය අයියා ලා එන දිනය සඳහා වෙන් කිරීමට අත්තිකාරමක් ද ගෙව්වා.

අයියාට ත් අක්කාට ත් තවත් වැදගත් කරුණක් දැන්වීමට මා මේ ලිපියෙන් අදහස් කරනවා.



ඒත් සුරනිමල වෙනත් කුලයකට අයත් වන නිසා අම්මා කැමති කරවා ගැනීම අපහසු බවයි තාත්තාගේ හැඟීම.

මා සමග වෛද්‍ය විද්‍යාව හදාරන අය අතුරින් සුරනිමල මා සමග දක්වන්නේ ඉතාම ලෙන්ගතු කමක්. ඔහු ඉතා නිහතමානී, විනීත, ගුණ ගරුක, අප වැනිම ගුරු දෙමාපියන්ගෙන් පැවත එන පවුලක වැඩිමහල් පිරිමි දරුවා. ඔහුට උසස් පෙළ ඉගෙනුම ලබන නැගණියක සිටී.

සුරනිමල මා සමග කිට්ටු සබඳකමක් බලාපොරොත්තුව සිටී. මා මින් අදහස් කළේ කුමක් දැයි ඔබට වැටහෙනු ඇති. මා මේ ගැන තාත්තා සමග කතා කළා. තාත්තා නම් අකමැති නැහැ. ඒත් සුරනිමල වෙනත් කුලයකට අයත් වන නිසා අම්මා කැමති කරවා ගැනීම අපහසු බවයි තාත්තාගේ හැඟීම. තාත්තා පෙර සේම කියන්නේ විනීත ගුණ ගරුක උගත් අයෙකු සැම විටම බ්‍රාහ්මණයකු නැත්නම් කුලවන්තයකු ලෙස සැලකීම සත් ගුණවත් මිනිස් ගතියක් බවයි.

එහෙත් අම්මා එසේ නොසිතනු ඇති යැයි මට බයයි. මට ඇයට එරෙහිව යා නොහැකි බව අයියා දන්නවානේ. සුරනිමලගේ දෙමාපියන්ද කියා ඇත්තේ විවාහයකදී දෙපාර්ශ්වයේම දෙමාපිය වැඩිහිටි ආශිර්වාදය ඉතා වැදගත් බවයි.

ඔබ ලංකාවට පැමිණි පසු අම්මාට කරුණු පහදා දී ඇගේ සිත නම්මා ගැනීමට ඔබට හැකි වන බව තාත්තා විශ්වාස කරනවා. සුරනිමල හා මා අතර ඇත්තේ මිත්‍රත්වයක් පමණක් වුවත් ඔහුගෙන් තොර අනාගතයක් ගැන සිතීමට පවා මට නොහැකි යි. ඔහු දුටු දිනක ඔබද ඔහුගේ ගතිගුණ අගයනු ඇතැයි මම තරයේ විශ්වාස කරමි.

අක්කා සමගද මෙය කතා කරන්න. ඔබලා පැමිණි පසු අපි සුදුසු පිළියමක් සූදානම් කරමු.

ඔබ තිදෙනා ගේ පැමිණීම ඉතා ආදරයෙන් බලාපොරොත්තු වෙමි.

මේ සදාදර නංගී, සුදර්ශණී."

'බලන්නකො ධම්මි මේ නංගිගේ ලියුම ටිකක් කියවලා.'

'පව්නේ රංග, මම කියන්නම් අපි ලංකාවට ගියාම මුලින් ම සුරනිමලව මුණ ගැහෙමු. ඊට පස්සේ අම්මට කරුණු පහදල දෙමු.'

'සුරනිමලත් දොස්තර කෙනෙක් වන නිසා කුලය මොකක් උනත් අම්මාව කැමති කර ගන්න එක අපහසු වෙන එකක් නැහැ මම හිතන්නේ.'

'අනික ඔයා කීවම අම්මා පිළිගනීවි. ආචාර්ය රංගසිරි ජයදාසගෙ දේශනයක් සහ එහි ප්‍රතිඵල අපට එහෙනම් බලා ගන්න පුළුවන්.' ධම්මි සිනාසෙයි.

* * *

අප ලංකාවට පැමිණ සතියකින් ධම්මිත් නංගීත් සමග මම සුරනිමල මුණ ගැසුනෙමි. නංගී කියා තිබූ පරිදි ඔහු ඉතා විනීත, වෛද්‍ය වෘත්තියට ම සුදුසු, කාරුණික කතාවෙන් යුතු පුද්ගලයකු බව අපට හැඟී යාමට වැඩි වේලාවක් ගත නොවුනි. 'අයියා' හා 'අක්කා' යනුවෙන් අප ඇමතීමට ඔහු පැකිලුනේ නැත. සුරනිමලගේ නිහතමානී බව හා ඉතා සංවර කතා විලාසය නිසා අම්මාගේ හිත ඔහු කෙරේ නම්මා ගැනීම අසීරු නොවනු ඇතැයි මට සිතුනි. ලබන සෙනසුරාදා දහවල් කෑමට අප නිවසට එන ලෙස කළ ආරාධනය ඔහු පිළිගත්තේ කෙතරම් කාරුණිකවද?

සෙනසුරාදා අම්මා හා ධම්මි සමග එකතු වූ නංගී සුරනිමල සඳහා දහවල් ආහාර පිළියෙල කරමින් සිටියේ ඉතාමත් සතුටිනි. වරක් මා කුස්සියට යන විට 'සැළලිහිණියෝ නුඹ දන්නේ නෑ...' ගීතය හෙමිහිට ගායනය කරමින් සිටි ඇය මා දුටු වනම එය නවතා ලජ්ජාවෙන් බිම බලාගත් බව අම්මා දුටුවේ නැත.

'රංග, සෙනෙවි අයියා දැන් කෝල් කරලා කිව්වා ගම්පහ රැස්වීමට ආව ගමන් අපිව බලන්න තව පැය බාගයකින් විතර එනවා කියලා. දවල් කෑමට ඉන්න බෑ කීවා. ජනාධිපති තුමා හමුවෙන්න ඕනෙලු දෙලහට.' ➔

## තවත් වසන්තයක්

*ෂෙල්ටන් පීරිස් ලියූ කෙටිකතාවකි*

'ඒක හොඳයි. අයියව අවුරුදු දෙකකින් දැක්කෙ නැහැනේ.'

ටික වෙලාවකින් ආමි සහ පොලිස් වාහන දෙකක් සමඟ කාරයක් අප නිවස ඉදිරිපස නැවතුනි.

'රංග සෙනෙවි අයියා ආවා.'

සෙනෙවි අයියා මුලින්ම කළේ අම්මාට හා තාත්තාට දණ ගසා වැඳ ආචාර කිරීමයි. ඊට පසු අප දෙදෙනා හා පුතාවද වැළඳ ගත්තේ සෙනෙහසින්.

'සෙනෙවි පුතේ. අද දවල්ට කෑම ටිකක් කාලම යන්න. අද අපේ පොඩි දුවගේ යාළුවෙකුත් එනවා කීවා දවල් කෑමට.'

'අනේ බැහැ නැන්දෙ. මට දෙලහට ජනාධිපති තුමා හමුවෙන්න තියෙනවා. ඒ නිසා තේ ටිකක් බොමු. ඒ ඇති.'

*අධ්‍යාපන ඇමති තුමාට කියලා පුතාව ලබන අවුරුද්දෙ ඉඳලා රෝයල් එකට දා ගත්තා. දැන් එයා හත වසරෙනේ.*

'කොහොමද අයියේ රාණි අක්කයි පුතයි? පුතා තවම යන්නේ ගමේ ඉස්කෝලෙටද?'

'මම කරන්නෙ නැහැ කියලා රාණිම අපේ අධ්‍යාපන ඇමති තුමාට කියලා පුතාව ලබන අවුරුද්දෙ ඉඳලා රෝයල් එකට දා ගත්තා. දැන් එයා හත වසරෙනේ.'

'රාණි අක්කා නිසා තමයි නංගියෙ මට මේ වගේ සේවයක් රටට කරන්න පුළුවන්.'

'රංග මල්ලි ගැන මම අපේ උසස් අධ්‍යාපන ඇමති තුමාට කීවා. එතුමා ඉතාම හොඳ කෙනෙක්. එතුමා කියනවා අපට ඕනේ උගත් අවංක කට්ටියක් කියලා. මල්ලිට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ වැඩක් බාර දෙන්න ඕන කීවා. එයාට ඕන විශ්ව විද්‍යාල ටික ප්‍රශ්ණ නැතුව පවත්වාගෙන යන්න. මල්ලි පේරාදෙණියත් කොළඹත් හොඳින් දන්න නිසා ඒක ලේසි වේවි. මල්ලි කැමති නේද?'

'හරියට වැඩ කරන්න ලැබෙනවා නම් මම ඕන වැඩක් බාර ගන්නම්, රටේ අභිවෘද්ධිය සඳහා!'

'එහෙනම් ඇමතිතුමා ඒ ගැන කටයුතු කරාවි.'

ඒ අතර සූරනිමල පැමිණියෙන් අපේ කතාව නතර විනි.

'සූරනිමල මේ අපේ සෙනෙවි අයියා.'

'අයියේ මේ සූරනිමල මෙඩිකල් ස්ටුඩන්ට් කෙනෙක්. නංගිගෙ යාළුවෙක්.'

සූරනිමල අයියාට අතට අත දී ආචාර කළේය.

'රංග අයියෙ මම බය උනා ආමි හා පොලිස් ජීප් ඔයාලගේ ගේ ඉස්සරහ නවත්වල තියෙන නිසා. එයාලා මා දිහාත් හොඳට බැලුවා. ඒ මොකද?

සූරනිමල දන්නවා ඇතිනේ මේ අපේ විදේශ ඇමති තුමා. හැබැයි මේක රාජකාරි ගමනක් නෙවි. රාජකාරියට යන ගමන්.' අපි සැවොම සිනාසුනෙමු.

තේ පානයෙන් පසු සෙනෙවි අයියා පිට වූයේ හැකි විගස අප සැම සඳහා ඔහුගේ නිවසේ සාදයක් පවත්වන බව සඳහන් කරමිනි.

කතාවෙන් කතාවෙන් දහවල් දෙළහමාර ද පසුවී ඇති බව දැනුනේ නැත. අම්මා, ධම්මි හා නංගී කෑම මේසය සූදානම් කොට තිබුණි.

'රංග අයියලට මේ දෙල් කොස් වගේ ඒවත් ලංඩන් වලදි කන්න ලැබුනද?'

'ඔව් මල්ලි. එහේට පිටරටවලින් මේ වාගේ කෑම ගෙන්වනවා.'

'අපි නම් එකම දවසයි ගෙනැල්ල හැදුවේ. ඒ වගේම ලංකාවෙ කෑමත් ටින් කරලා එහාට යවනවා. ඒත් අපි නම් වැඩිය කන්නෙ නැහැ. ලංකාවට එනකම් හිටියා මේ වගේ රසට කන්න.'

'ඔයාට ඉතිං අම්මාගෙ කෑම කොහොමත් රස නේ.'

'අනේ මම නෙවි පුතේ ඉව්වේ? මම බැලුවා විතරයි. පොඩි දුවයි ලොකු දුවයි තමයි ඔක්කොම කළේ.'

'මම හිතුවා නංගි කරන්නෙ මෙඩිසින් කියල. හෝම් සයන්ස් වෙන්න ඇති එහෙනම් කරන්නේ. කොහොමටත් බෙහෙත් වගේම හොඳ කෑමත් ලෙඩ්ඩුන්ට අවශ්‍ය නේ.'

නිශ්ශබ්දව සිටි තාත්තා 'ඒක නම් ඇත්ත තමයි පුතේ. හොඳ රස කෑම ටිකක් කෑවාම ඔක්කොම ලෙඩ අමතක වෙනවා. අපේ පොඩි දොස්තර නෝනටත් හොඳට උයන්න පුළුවන් එක හරිම හොඳයි. වාසනාවයි.'

සූරනිමල අපේ නිවසින් පිට වූයේ සවස හතර ට පමණ තේ පානයෙන්ද පසුවය.

සූරනිමල ගෙදරින් පිට වී ඇත්තේ අම්මා ගේ සිත තදින්ම නම්මා ගෙන බව අපට වැටහුනේ සැනකිනි. තාත්තාට ඔහු ගැන විස්තර කියා තිබුනත් ඒ කිසිවක් නොදත් අම්මා 'අනේ සූරනිමල හරිම රත්තරං ඉලන්දාරියෙක්. දාහකින් හොයා ගන්න බැරි කෙනෙක්. මොකක්ද දුවේ එයාගෙ වාසගම කීවෙ. ඒ මොකක් උනත් සූරනිමලට ඕනම පවුලකට සම්බන්ධ වෙන්න වාසනාව තියෙනවා. දොස්තර කමට ඔබින ඉලන්දාරියා.'

*'නිබ්බුතා නූන සා මාතා - නිබ්බුතා නූන සෝ පිතා*
*නිබ්බුතා නූන සා නාරී - යස්සායං හී දිසා පතී'*

අම්මාගේ ප්‍රතිචාරයන් නිසා තාත්තා අප ඇතුළු සියලු දෙනට සැනසුම් සුසුම් හෙළිනි. ඉන් නොනැවතුන අම්මා 'මට හිතෙන්නේ මම කොහේදි හරි සූරනිමල දරුවව දැකලා තියෙනවා. සමහර විට සූරනිමල පෙර

➔

## තවත් වසන්තයක්

*ෂෙල්ටන් පීරිස්*

ආත්මෙක මගේ දරුවෙක් වෙලා ඉන්න ඇති. නැත්නම් කිට්ටු නෑයෙක් වෙලා ඇති.'

'අම්මා කැමතිද එහෙනම් එයා අපේ පවුලට සම්බන්ධ වෙනවා නම්?'

'මොන වගේ සම්බන්ධයක් ද?'

නංගී නැගිට ගියේ ලැජ්ජාවෙන් වෙන්න ඇති. එය වටහා ගත් තාත්තා,

'පොඩි දුව මට වතුර ටිකක් ගේන්න.'

'අපි හිතමු එයා නංගි එක්ක යාළු වෙනවා කියලා.'

'පොඩි දුව කැමති නම් මගේ අකමැත්තක් නැහැ පුතේ.'

ඒ සමගම තාත්තාට වතුර වීදුරුවක් රැගෙන ආ නංගී දෙනෙතින් වැගිරෙන සතුටු කඳුළු සමග අම්මාට සියළු දේ නැවත විස්තර කළේ අහිංසක මුවැත්තියක් ලෙසිනි.

සියල්ල අසා සිටි අම්මා කතා කළේ ඉතා සංසුන්ව. 'එහෙනම් මේක මේ ඔක්කොමල ගෙම කුමන්ත්‍රණයක්. කොහොමටත් සියල්ල සිදුවෙන්නෙ හොඳටනේ, මගේ පොඩි දුවේ.'

'ලොකු මහත්තයො. මේක එහෙනම් ඉක්මනටම සුරනිමලගෙ දෙමව්පියන්ට දන්වන එක හොඳයි.'

'ඒ අය මේක දන්නවා අම්මෙ. අම්මගේ කැමැත්ත ලැබෙන කම් තමයි හිටියෙ. මම සුරනිමලට ටෙලිෆෝන් කරලා විස්තරය කියන්නම්. එයා තවම මග ඇති.'

'එයා නම් දැන් හරිම සතුටු වේවි.' ඒ කීවෙ ධම්මි.

'අම්මේ! තවත් ශුභ ආරංචියක් දන්වන්න තියෙනවා.'

'මොකක්ද පුතේ ඒ.'

'ධම්මිට තව බබෙක් ලැබෙන්න ඇවිල්ලා.'

'අනේ වාසනාවන්!' ඒ අම්මා.

*'පතිරූප දේස වා සෝච - පුබ්බේත කත පුඤ්ඤතා*
*අත්ත සම්මා පණිධිච - ඒතං මංගල මුත්තමං'*

යනුවෙන් තාත්තා මංගල කරුණු එසේ දැක්වීය.

සියල්ල බඹා කෙටූ ලෙසම සිදුවෙමින් තිබුණි.

**නිමි.**

Published by the Sinhalese Cultural Forum of NSW, Aug. 2008